# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## කනිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ කනිෂ්ඨ කළමනාකාර – තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **කනිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ නිලධාරී - තනතුරු (01)**

01. **අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

(i). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය / පරිගණක විද්‍යා උපාධිය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක්

හෝ

(ii). තොරතුරු තාක්ෂණ විෂයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

(iii). තොරතුරු තාක්ෂණ විෂයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පෞද්ගලික අංශයේ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(iv). තොරතුරු තාක්ෂණ විෂයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පෞද්ගලික අංශයේ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

(පෞද්ගලික අංශයේ සේවා පළපුරුද්ද ද මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ.)

- **වයස් සීමාව :** අවුරුදු 22-45

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවත් සඳහා වයස් සීමාව අදාළ නොවේ.)

- **වැටුප් පරිමාණය :**

JM 1.1

රු : (42,600/= - 10×755/= - 18×1,135/= - 70,580/=)

රු : 65,400/- ක සියලු දීමනා සහිත මූලික වැටුප් පියවරෙහි තබන අතර, වරින් වර රජය විසින් අනුමත අතිකූත් සියලුම දීමනා ද හිමි වේ.

- **පොදු කොන්දේසි**

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, වසර 03ක පරිවාස කාලයකට යටත් ය.

සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් 8% ක දායක මුදලක් ගෙවිය යුතු අතර, අරමුදල විසින් 16% ක් ගෙවනු ලැබේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට, අරමුදල විසින් 3% ක දායක මුදලක් ගෙවනු ලැබේ. මෙයට අමතරව වාර්ෂික ප්‍රසාද දීමනාව සහ මාසික ප්‍රවාහන දීමනාවට හිමිකම් ලබයි.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත පහත සඳහන් ලිපිනයට 2024.05.22 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලේඛනවල ඡායා පිටපත්ද සමඟ පහත ලිපිනයට එවිය යුතුය. තවද මෙම සහතික පත්වල මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. සේවා සහතික
4. මෑතකදී ලබාගත් චරිත සහතික 02

**පාලන භාරකාර,**
**ලෝහෝර් ආර්යා ණය අරමුදල,**
**අංක: 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**
**කොළඹ - 02.**